# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2348/23 - 2023 සැප්තැම්බර් මස 05 වැනි අඟහරුවාදා - 2023.09.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**සමථ මණ්ඩල කොමිෂන් සභාව**

සමථකාරවරුන් ලෙස පත්කිරීම සඳහා නාමයෝජනා කැඳවීමේ නිවේදනය

2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනතේ 2 සහ 3 වන වගන්ති යටතේ අමාත්‍යවරයා විසින් 2021.12.21 දිනැති අංක 2259/11 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝග අනුව එකී විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශ සඳහා සමථකාරවරුන්ගේ මූල මණ්ඩලයන් පිහිටුවීම සඳහා 1988 අංක 72 දරන සමථ මණ්ඩල කොමිෂන් සභා පනත යටතේ පත් කර ඇති සමථ මණ්ඩල කොමිෂන් සභාව විසින්, එකී 2003 අංක 21 පනතේ 4 වන වගන්තියේ (1) සහ (2) වන උපවගන්ති ප්‍රකාරව සිදු කරනු ලබන නිවේදනය යි.

ඒ අනුව, පහත දැක්වෙන විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශයන්හි තනි පුද්ගලයින් හෝ ආයතන අතර සහ තනි පුද්ගලයින් අතර හෝ ආයතන අතර මූල්‍ය ව්‍යාපාර ගණුදෙනුවලින් උපචිත වන මූල්‍ය ආරවුල් විසඳීමට පිහිටුවනු ලබන විශේෂ සමථ මූල මණ්ඩලයන් (මූල්‍ය) හි සභාපති සහ සමථකරුවන් ලෙස කටයුතු කිරීමට සුදුස්සන් පත්කර ගැනීම සඳහා නාමයෝජනා කැඳවනු ලැබේ.

- කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය
- ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය
- මහනුවර පරිපාලන දිස්ත්‍රික්කය
- මොණරාගල පරිපාලන දිස්ත්‍රික්කය
- පොලොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කය
- අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කය

02. එකී විශේෂ සමථ මූල මණ්ඩලයක සාමාජික සමථකාරවරයෙකු ලෙස කටයුතු කිරීම සඳහා නාම යෝජනා ඉදිරිපත් කරනු ලබන විට අදාල විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශයෙහි ඕනෑම ස්ථානයක මෙම තනතුරෙහි රාජකාරී සිදුකළ හැකි පහත සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින්ගේ නාමයන් යෝජනා කළ යුතු වේ.

(*අ*) වයස අවුරුදු 35 සහ 75 අතර විය යුතුය,

(*ආ*) (I) අවම වශයෙන් වසර පහක අඛණ්ඩ කාලසීමාවක් මාණ්ඩලික නිලධාරි මට්ටමේ රජයේ නිලතල දරන හෝ දැරූ නිලධාරියෙකු හෝ විය යුතුය;

(II) පුද්ගලික අංශයේ, රාජ්‍ය නොවන සංවිධානයක, බැංකුවක හෝ සංස්ථාවක ජ්‍යෙෂ්ඨ කළමනාකාර තනතුරක් දරන හෝ දැරූ තැනැත්තෙකු විය යුතුය; හෝ

(III) කිසියම් ලිඛිත නීතියක් මඟින් හෝ යටතේ ස්ථාපිත පිළිගත් වෘත්තීය හෝ උසස් අධ්‍යාපන අධිකාරියකින් ලබාගත් වෘත්තිය හෝ අධ්‍යාපන සුදුසුකමක් ලබා තිබිය යුතුය; සහ

(ඇ) මනා මානසික සහ ශාරීරික යෝග්‍ය තත්ත්වයක් සහිත විය යුතුය;

03. එකී විශේෂ සමථ මූල මණ්ඩලයක සමථකරුවන් තෝරා පත් කර ගැනීම සඳහා ඉහත සුදුසුකම් සපුරනු ලබන පුද්ගලයින්ගේ නාම යෝජනා සමථ මණ්ඩල කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන ලෙස පහත නිලධාරීන්ගෙන් මණ්ඩල/සංවිධාන/ආයතන වලින් ඉල්ලා සිටිනු ලැබේ.

(අ) නාම යෝජනා ඉදිරිපත් කරනු ලබන පුද්ගලයා පදිංචිව සිටිනු ලබන හෝ රැකියාව සිදු කරනු ලබන ප්‍රදේශයේ දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම්වරුන් ;

(ආ) දක්වා ඇති විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශ වන පරිපාලන දිස්ත්‍රික්කයන් තුළ,

(I) පිහිටි කාර්යාලයන්හි දෙපාර්තමේන්තු/ප්‍රාදේශීය දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු වන රාජ්‍ය නිලධාරිවරුන් හෝ පළාත් රාජ්‍ය නිලධාරිවරුන්,

(II) පිහිටි ආගමික පූජනීය ස්ථානයක හෝ පාසලක ප්‍රධානීන්,

(III) පදිංචි විශ්‍රාමලත් දෙපාර්තමේන්තු හෝ පාඨශාලා ප්‍රධානීන්, සහ

(IV) අවම වසර පහක් (05) ඇතුළත ක්‍රියාකාරීව පවත්නා පහත අරමුණු එකක් හෝ වැඩි ගණනක් සඳහා පිහිටුවා ඇති යම් මණ්ඩලයකට, සංවිධානයකට, හෝ ආයතනයකට:

- සමාජයේ අධ්‍යාපනික, ආගමික සදාචාරාත්මක හෝ අධ්‍යාත්මික වර්ධනය වැඩිදියුණු කිරීම සඳහා,
- සමාජ සුභසාධනය වර්ධනය කිරීම හෝ දුගී බව තුරන් කිරීම සඳහා, ග්‍රාමීය හෝ ප්‍රජා සංවර්ධනය වැඩිදියුණු කිරීම සඳහා,
- සංස්කෘතික හෝ ක්‍රීඩා වැඩිදියුණු කිරීම සඳහා,
- සෞඛ්‍ය, ආහාර හා නිවාස වැනි ජනයාගේ මූලික අවශ්‍යතාවන් සැලැස්වීම සහ සපයා දීම අරමුණු කරගත් ව්‍යාපෘති, වැඩසටහන් සහ කටයුතු වැඩි දියුණු කිරීම සඳහා,

04. ඉහත 3 (අ) යටතේ විශේෂ සමථ මූල මණ්ඩලයක සමථකාරවරුන් ලෙස පත් කිරීම සඳහා සේවයේ යෙදෙන හෝ විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන් වන පුද්ගලයින්ගේ නම් පමණක් යෝජනා කළ හැකි අතර,

03 (ආ) යටතේ සේවයේ යෙදෙන හෝ විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන්ගේ, පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ සහ රාජ්‍ය නිලධාරීන් නොවන පුද්ගලයන්ගේ නම් ඉදිරිපත් කිරීමට අදාල නාම යෝජක වෙත හැකියාව ඇත.

05. නාමයෝජනා කිරීමේ ආකෘති පත්‍රය ඃ

(අ) පුද්ගලයින් විසින් නාමයෝජනා ඉදිරිපත් කළ යුත්තේ පහත දැක්වෙන 'අ' ආකෘති පත්‍රයට අනුකූලවය.

(ආ) මණ්ඩල සංවිධාන සහ ආයතන විසින් නාමයෝජනා ඉදිරිපත් කළ යුත්තේ 'ආ' ආකෘති පත්‍රයට අනුකූලවය.

(ඇ) දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් නාමයෝජනා ඉදිරිපත් කළ යුත්තේ 'ඇ' ආකෘති පත්‍රයට අනුකූලව ය.

එක් එක් නාමයෝජනාව වෙනම ආකෘති පත්‍රයක ලියා ඉදිරිපත් කළයුතු අතර, මීළඟ ඡේදයේ දක්වා ඇති පරිදි නාමයෝජනාව ඉදිරිපත් කරන අයගේ නිර්දේශය ද නොවරදවාම එහි ඇතුළත් කළ යුතුය.

06. නාමයෝජකගේ නිර්දේශ හේතු රහිත නිර්දේශයක් නොවිය යුතුය. සමථකාරවරුන්ගේ මූල මණ්ඩලයට පත් කිරීම සඳහා යෝජනා කරන තැනැත්තාගේ යෝග්‍යතාවය හෝ අයෝග්‍යතාවය පිළිබඳ සිය නිශ්චයට එළඹීමට කොමිෂන් සභාවට හැකිවන පරිදි නිශ්චිත කරුණු එම නිර්දේශයේ දැක්විය යුතුය.

උදාහරණයක් වශයෙන් ඔහුගේ/ ඇයගේ වර්තමාන හෝ කලින් රක්ෂාව, එම වෘත්තියේ සේවය කළ නැතහොත් යෙදී සිටි කාලපරිච්ඡේදය ඔහු/ ඇය විසින් දරන ලද යම් විශ්වාස හෝ වගකීම් සහිත තනතුරක් හෝ ඔහු/ ඇය විසින් යම් සමාජ සේවා, ආගමික පුණ්‍ය සංවිධානයක, සංගමයක, මණ්ඩලයක දරන ලද නිලය තිබේ නම් එය ද සඳහන් කළ යුතුය.

07. කිසියම් පුද්ගලයෙක් හෝ මණ්ඩලයක්, සංවිධානයක් හෝ ආයතනයක් එකම සමථ මණ්ඩල ප්‍රදේශයක් සම්බන්ධයෙන් නාමයෝජනා තුනකට වැඩි සංඛ්‍යාවක් ඉදිරිපත් කිරීමෙන් හැකි තරම් දුරට වැළකී සිටිය යුතුය. එහෙත් ප්‍රාදේශීය ලේකම්වරුන්ට / දිස්ත්‍රික් ලේකම්ට මෙම සීමාව අදාළ නොවේ.

08. සියලුම නාමයෝජනා 2023 ඔක්තෝබර් 31 දිනට හෝ ඊට පෙර **කොළඹ 12, අධිකරණ මාවත, අධිකරණ අමාත්‍යාංශ නව ගොඩනැගිල්ල, අංක 80 ලිපිනයේ පිහිටි සමථ මණ්ඩල කොමිෂන් සභාවේ ලේකම්** වෙත ලැබෙන පරිදි එවිය යුතුය.

09. සම්මුඛ පරීක්ෂණයක් මඟින් මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පුහුණුව සඳහා යෝග්‍ය බවට නිර්දේශ කරනු ලබන තැනැත්තන් සමථකරණ දක්ෂතා සහ උපක්‍රම පිළිබඳව සහ නීතිය සහ අදාළ ක්ෂේත්‍රය පිළිබඳව පුහුණු පාඨමාලාවක් හැදෑරීමට යොමු කරනු ඇත. පුහුණු පාඨමාලාවෙන් සුදුසුකම් ලබන තැනැත්තන් ලකුණු ලබා ප්‍රමුඛතාවය අනුව සමථ මණ්ඩල කොමිෂන් සභාවේ අභිමතය පරිදි සමථකරුවන් ලෙස පත්කිරීමට කටයුතු කරනු ඇත. සුදුසුකම් ලැබූ සාමාජිකයින් අතුරින් අයෙක් සමථ මණ්ඩල කොමිෂන් සභාවේ නිර්දේශ මත සභාපතිවරයා ලෙස පත් කරනු ලැබේ.

10. මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද සමථ මණ්ඩල කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය.

**ඒ. එස්. පී. වීරසූරිය,**
ලේකම්,
සමථ මණ්ඩල කොමිෂන් සභාව.

2023 සැප්තැම්බර් මස 01 වැනි දින.
කොළඹ 12,
අධිකරණ මාවත,
අංක 80,
අධිකරණ අමාත්‍යාංශ නව ගොඩනැගිල්ල,
සමථ මණ්ඩල කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

## 'අ' ආකෘති පත්‍රය

(*නාමයෝජනා ඉදිරිපත් කිරීමට සුදුසු පුදගලයින් විසින් පිරවීම සඳහා*)

1. විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශය : ..........................................................................................................

2. පරිපාලන දිස්ත්‍රික්කය : ..........................................................................................................

3. නාමයෝජනාව ඉදිරිපත් කරන පුද්ගලයා පිළිබඳ විස්තර :
   (*අ*) සම්පූර්ණ නම : ..........................................................................................................
   (*ආ*) පදිංචි ලිපිනය : ..........................................................................................................
   (*ඇ*) ඔබ නාම යෝජනාව ඉදිරිපත් කරන්නේ කුමන තත්වයෙන් ද යන බව : ......................................................

   (I) ඔබ දෙපාර්තමේන්තු ප්‍රධානියෙක් ද? එසේ නම් පහත තොරතුරු සඳහන් කරන්න.
   දෙපාර්තමේන්තුවේ නම : ..........................................................................................................
   රාජකාරී ලිපිනය : ..........................................................................................................
   ඔබ දරන තනතුර : ..........................................................................................................

(II) ඔබ පූජනීය ස්ථානයක ප්‍රධානියෙක් ද? එසේ *නැතහොත්* ප්‍රාදේශීය දෙපාර්තමේන්තු ප්‍රධානියෙක් ද? *නැතහොත්* පාසලක ප්‍රධානියෙක් ද? එසේ නම් පහත තොරතුරු සඳහන් කරන්න.
එහි නම : ................................................................................................................
එහි ලිපිනය : ...........................................................................................................
ඔබ දරන තනතුර : .....................................................................................................

(III) ඔබ විශ්‍රාම ලත් දෙපාර්තමේන්තු ප්‍රධානියෙක් ද? එසේ *නැතහොත්* විශ්‍රාමලත් පාඨශාලා ප්‍රධානියෙක් ද? එසේ නම් පහත තොරතුරු සඳහන් කරන්න.
ආයතනයේ නම : ........................................................................................................
ඔබ විශ්‍රාම ගන්නා විට දරන ලද තනතුර : ..................................................................
ඔබ පදිංචිව සිටින සමථ මණ්ඩල ප්‍රදේශය (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය) : ..........................

4. ඔබ විසින් නාම යෝජනා කරනු ලබන තැනැත්තා පිළිබඳ විස්තර :
(*අ*) ඔහුගේ/ ඇයගේ සම්පූර්ණ නම : .........................................................................
(*ආ*) ඔහු/ඇය පදිංචි ලිපිනය : ..................................................................................
(*ඇ*) උපන් දිනය : ..................................................................................................
(*ඈ*) ජාතික හැඳුනුම්පත් අංකය : ..............................................................................
(*ඉ*) දුරකථන අංකය : ...............................................................................................
(*ඊ*) ඔහු/ඇය පදිංචිව සිටින්නේ ඉහත සඳහන් කරනු ලැබූ සමථ මණ්ඩල ප්‍රදේශය තුළ ද? එසේ නැතහොත් එකී සමථ මණ්ඩල ප්‍රදේශයෙන් පිටත ද? : ..........................................................................
(*උ*) ඔහු/ඇය එකී සමථ මණ්ඩල ප්‍රදේශය තුළ යම් වැඩක යෙදී සිටින්නේ ද? එම ප්‍රදේශයෙන් පිටත වැඩක යෙදී සිටින්නේ ද ? : ..........................................................................................
(*ඌ*) ඔහු/ඇය රාජ්‍ය නිලධාරියෙකු ද? එසේනම් ඔහු/ඇය දරන තනතුර සඳහන් කරන්න. ...........................
(*එ*) ඔබගේ නිර්දේශය ඊට හේතු ද සහිතව සඳහන් කරන්න. ..........................................................

.....................................
අත්සන
(මුද්‍රාව තිබේනම්)

දිනය : ......................................

**'ආ' ආකෘති පත්‍රය**

**(*නාමයෝජනා කිරීමට සුදුසුකම් ඇති මණ්ඩලයේ, සංවිධානයේ හෝ ආයතනයේ ලේකම් විසින් පිරවිය යුතු ය.*)**

1. විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශය : ..............................................................................

2. පරිපාලන දිස්ත්‍රික්කය : ........................................................................................

3. නාමයෝජනාව ඉදිරිපත් කරන මණ්ඩලය, සංවිධානය හෝ ආයතනය පිළිබඳ විස්තර :
(*අ*) එහි නම : .........................................................................................................
(*ආ*) එහි ලියාපදිංචි/ රාජකාරි ලිපිනය : ...................................................................
(*ඇ*) එය ලියාපදිංචි කරන ලද හෝ පිහිටුවන ලද දිනය : ..............................................
(*ඈ*) එය කොතරම් කාලයක සිට පැවැතෙන්නේ ද යන බව : .........................................
(*ඉ*) එයින් ඉටු කෙරෙන අරමුණ හෝ සිදුවන මෙහෙය : ...................................................

4. නාම යෝජනා කරනු ලබන තැනැත්තා පිළිබඳ විස්තර :
(*අ*) ඔහුගේ/ ඇයගේ සම්පූර්ණ නම : .........................................................................
(*ආ*) ඔහු/ඇය පදිංචි ලිපිනය : ..................................................................................

(ඇ) උපන් දිනය : ..........................................................................................................

(ඈ) ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................................................

(ඉ) දුරකථන අංකය : ..........................................................................................................

(ඊ) ඔහු/ඇය පදිංචිව සිටින්නේ ඉහත සඳහන් කරනු ලැබූ සමථ මණ්ඩල ප්‍රදේශය තුළ ද? එසේ නැතහොත් එකී සමථ මණ්ඩල ප්‍රදේශයෙන් පිටත ද? : ..........................................................................................................

(උ) ඔහු/ඇය එකී සමථ මණ්ඩල ප්‍රදේශය තුළ යම් වැඩක යෙදී සිටින්නේ ද? එම ප්‍රදේශයෙන් පිටත වැඩක යෙදී සිටින්නේ ද? : ..........................................................................................................

(ඌ) ඔහු/ඇය රාජ්‍ය නිලධාරියෙකු ද ? එසේ නම් ඔහු දරන තනතුර සඳහන් කරන්න : ..........................................................................................................

5. අදාළ මණ්ඩලය, සංවිධානය හෝ ආයතනය ඔහුගේ/ඇයගේ නාමයෝජනාවට අවසර දෙමින් යෝජනාවක් සම්මත කර ඇද්ද? එසේනම් එම යෝජනා සම්මතයේ දිනය සඳහන් කරන්න : ..........................................................................................................

6. මණ්ඩලයේ, සංවිධානයේ හෝ ආයතනයේ නිර්දේශය ඊට හේතු ද සමග සඳහන් කරන්න. : ..........................................................................................................

....................................

ලේකම්

(මණ්ඩලයේ, සංවිධානයේ හෝ ආයතනයේ මුද්‍රාව)

දිනය : ......................................

'ඇ' ආකෘති පත්‍රය

(*නාමයෝජනා ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් විසින් පිරවිය යුතු ය.*)

1. විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශය : ..........................................................................................................

2. පරිපාලන දිස්ත්‍රික්කය : ..........................................................................................................

3. නාමයෝජනාව ඉදිරිපත් කරන දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් පිළිබඳ විස්තර :

(අ) ඔබගේ සම්පූර්ණ නම : ..........................................................................................................

(ආ) ඔබගේ රාජකාරි ලිපිනය : ..........................................................................................................

(ඇ) ඔබ දිස්ත්‍රික් ලේකම්ව සිටින්නේ කුමන දිස්ත්‍රික්කයක ද? : ..........................................................................................................

(ඈ) ඔබ ප්‍රාදේශීය ලේකම්ව සිටින්නේ කුමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ද? : ..........................................................................................................

4. නාම යෝජනා කරනු ලබන නිලධාරියාගේ විස්තර :

(අ) ඔහුගේ/ අයගේ සම්පූර්ණ නම : ..........................................................................................................

(ආ) ඔහු/ඇය රාජ්‍ය නිලධාරියෙක් ද? එසේනම් ඔහු/ඇය දරන තනතුර සඳහන් කරන්න : ..........................................................................................................

(ඇ) උපන් දිනය : ..........................................................................................................

(ඈ) ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................................................

(ඉ) දුරකථන අංකය : ..........................................................................................................

(ඊ) ඔහුගේ/ ඇයගේ රාජකාරි ලිපිනය/ පෞද්ගලික ලිපිනය : ..........................................................................................................

5. ඔබගේ නිර්දේශය සහ ඊට හේතු ද සහිතව සඳහන් කරන්න : ..........................................................................................................

....................................

අත්සන

(මුද්‍රාව තිබේනම්)

දිනය : ......................................

EOG 09 - 0043

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.